නොතිබුණු හොඳ පැත්තක් මහේලගෙ තියන බව මට තේරුණා... ඒත් එයාට ආදරය කරන්න බලාපොරොත්තුවක් මා ළඟ කවදාවත් තිබුණෙ නැහැ ලහිරු... ඔයා අහගෙන ද ඉන්නෙ...?"
"ඔව් කියන්න..."
"ඔයාට මතක ද එදා රෑ තිබ්බ උත්සවය... අපේ උපාධිය ලැබුනු දවසෙ..."
"මට මතකයි..."

"මගේ බලාපොරොත්තු හැමදෙයක් ම ඉෂ්ඨ වුණායි කියල මම හිතපු දවසක් ඒ... මහේලගෙ යෝජනාව අවංකව ම මාව විවාහ කරගන්න අදහසින් කළ යෝජනාවක් කියලයි මම හිතුවෙ... නමුත්..."
"නමුත්..."

***"මේ ගත කරන්න යන අවුරුද්ද මගේ හදවතත්, මගේ අනාගත අරමුණුත් වෙනුවෙන් මම කරන පරීක්ෂාවක් ලහිරු... අවුරුද්ද අවසානයේ ඒ පරීක්ෂාවට මට ලැබෙන පිළිතුර මම ඔයාට දන්වන්නම්..."***

"මහේල මම තේරුම් අරන් තිබුණාට වඩා වෙනෙස් කෙනෙක් කියල මම ඉක්මනින් ම තේරුම් ගත්ත ලහිරු..."
"තේරුම් ගත්තට වඩා වෙනස් කෙනෙක්...?"
"ඔව් ලහිරු... මම සතුටින් බලාපොරොත්තු වෙච්ච අවංකකම එයා ළඟ තිබුණෙ නැහැ ලහිරු... ඊටත් වඩා මොකක් ද දෙන්නෙක් අතර බැඳීමට අවශ්‍ය කරන්නෙ..."
"ටාන්‍ය ඔයා තේරුම් ගත්ත වැරැදි වෙන්න බැරි ද?"

"කොහොම ද වැරැදි වෙන්නෙ ලහිරු... එයා අවංක නම් මටත් නොකියම වෙන කෙනෙක් ව විවාහ කර ගනියි ද?"
"එයාට ගෙදරින් කොයි විදිහට බලපෑම් ආව ද කියල අපි දන්නෙ නැහැනෙ හරියට ම ටාන්‍ය... එයාට සමහර විට වෙන කරන්න දෙයක් නැතිවෙන්න ඇති..."
මට ඒ බූරුවා රැක ගැනීමට කිසිවක් ම කිරීමේ අවශ්‍යතාවයක් නැත. නමුත් ඔහු කල ඒ නිගාදෙවන ක්‍රියාව නිසා මගේ රටටත් ජාතියටත් සිදුවන අවනම්බුව වෙනුවෙන් යමක් කිරීම මගේ යුතුකමකි.
"ඔයාට මතක ද අද දවල් ඔයා රොටනස් දූපතට ගිය ගමනක් ගැන කිව්ව..."
"ඔව් ඔයා හරියට වෙනස් වුණා එතනදි..."
"මහේලයි, යාළුවොයි එක්ක මාත් දවසක් ගියා ඒ ගමන..."

"ඇත්ත ද?"
"එදා ඒ ගමනෙදි මුල්වරට මට තේරුණා මහේල මට කරන්නෙ වංචාවක් කියල..."
"ටාන්‍යා ඇයි අපි මේ වැඩකට නැති පසුගිය දේවල් ගැන කතා කරන්නෙ... ඒක ඔයාගෙ හිතට දුකක්..." ඇය ගැඹුරු සුසුමක් හෙලා මොහෙතකට නිහඬ විය.

"ලහිරු... ඔයා හිතනව ද මම ලෙහෙසියෙන් රවට්ටගන්න පුළුවන් මෝඩ කෙල්ලෙක් කියල..."
"මම කවදාවත් එහෙම හිතන්නෙ නැහැ ටාන්‍යා... ඔයා ගැන දන්න කිසිකෙනෙක් එහෙම හිතන එකක් නැහැ..."
"ලහිරු මම දන්නෙ නැහැ හරියට ම ඔයාල ඔය කතා කරන ඕස්ට්‍රේලියානු සංස්කෘතියෙයි, ලංකාවෙ සංස්කෘතියෙයි තියෙන වෙනස ගැන කියන්න... නමුත් අපේ පවුල්වල අයත් හොඳ හැදියාවක්/චරිතයක් කියන එක අගේ කරනව ලහිරු..."
"මට තේරෙනව ටාන්‍ය... අනේ ඒත් මේ කතාව නවත්තමු මෙතනින්..." මගේ බල කිරීමට ඈ ඒ නීරස කතාව නවතා දැමුවාය. අප අතර නැවත වරක් නිහැඬියාවක් ඇති විය...

සියල්ල පෙර තිබූ පරිද්දෙන් යථා තත්වයට පත්කිරීම සඳහා මේ මගේ අවස්ථාව බව මම වටහාගෙන සිටියෙමි.

"ඔයා කොච්චර කාලයකට ද ලංකාවට යන්නෙ ටාන්‍යා...?"
"අවුරුද්දකට..."
"හ්ම්..."
"මම ඒත් දිගට ම ඔයාට ලිපි ලියන්නම් ලහිරු... ඉඩක් ලැබෙන හැටියට කතා කරන්නම්..."

"අවුරුද්දකට පස්සෙ ඔයා මොකක් ද කරන්න හිතන් ඉන්නෙ ටාන්‍ය...?"
"මේ ගත කරන්න යන අවුරුද්ද මගේ හදවතත්, මගේ අනාගත අරමුණුත් වෙනුවෙන් මම කරන පරීක්ෂාවක් ලහිරු... අවුරුද්ද අවසානයේ ඒ පරීක්ෂාවට මට ලැබෙන පිළිතුර මම ඔයාට දන්වන්නම්..."

මට ඈ කියන්නක් වැටහෙන්නේ නැත. නමුත් ඇගේ ඒ පරීක්ෂාවට මුහුණ දීමට සිදුවන්නේ මට බව පමණක් මට හැඟී යයි. මගේ සිතැඟි හෙළිදරව් කිරීමට අවස්ථාව නොලැබීම නිසා එක්තරා කාලයක් මම මගේ ආදරය යටපත් කරගෙන දුක් වින්දෙමි. දැන් ඊට අවස්ථාව යැයි මගේ යටි සිත මා උසි ගැන්වූව ද ඈ තුළ මතුවී පවතින මේ විපර්යාස ගොන්න නිසා ම මගේ සිතැඟි නැවත වරක් යටපත් කරගන්නට යැයි මගේ හදවතට බලකිරීමට මට සිදුව තිබේ. කාලයට සියල්ල විසඳීමට ඉඩ දෙමි යැයි සිතා මම තවදුරටත් නිහඬ වීමි.

දවස අවසාන වීමට ආසන්න බැවින් අපි හිඳ සිටි ස්ථානයෙන් පිටත් ව ආවෙමු. මගේ බලවත් ම ප්‍රතික්ෂේප කිරීම මත එදා ද ඇයට මා ඇගේ ගෙදරට ගෙන යාමට ඉඩක් ලැබුණේ නැත. අප අමතරව ගිය දුර මුළුමනින් ම නැවත පැමිණ මා හැරලවීමට ඇයට සිදු විය.

පසුව දා උදේ ද මම ඇයව නැවත මුණ ගැසුනෙමි. අවශ්‍ය වෙතැයි සිතූ පුද්ගලයන් කිහිප දෙනකුගේ ම ලිපිනත් වෙනත් තොරතුරුත් මම ඇයට ලබා දුන්නෙමි. ගුවන් තොටුපොළට නොයා මඟ දී ම සමුගැනීමට මා සිතා සිටින බව දැනගත් ඈ දුක් විය. නමුත් මගේ තීරණයේ මම දැඩිව සිටියෙමි.

මම ටාන්‍යා ගැන දුක්වන්නේ නැත. ඈ තුළ පවතින අරමුණක් වෙනුවෙන් සතුටින් ඈ අද පිටත්ව යනවා ඇතැයි මම සිතමි. නමුත් ඇයත් සමඟ රැගෙන යන්නේ වේදනාකාරී ලෙසට අත්හැරදමනු ලබන මගේ ජීවිතයේ අරමුණයි.... ඉතා අවාසනාවන්ත ලෙස අනුකම්පා විරහිත ඉරණමකට ලක්වන්නේ මගේ අනාගතය වෙනුවෙන් මා සතුව තිබූ එකම ප්‍රාර්ථනාවයි..... සැනසුමයි....

ඒ ගමන මා සමඟ යෑමේ උවමනාවක් ටාන්‍යාට නොතිබිණි. එසේ වූ නිසා ම ඒ ගමන අවසාන මොහොත දක්වා ඈ රහසක් කරගත්තා ය. ඇගේ වචනවලින් ම පැවසූ පරිදි ඈ මට කිසිදිනෙක ආදරය කළේ නැත. සමහර විට මතුවටත් කිසිදිනක ඈ මට ආදරය නොකරනු ඇත. මගේ පිපාසයට දිය බිඳක් සොයමින් මා ඇවිද යමින් සිටින්නේ මිරිඟුවක් පසුපස නොවේ ද...?

මගේ ආදරය පසුබිම් කරගෙන මා ලැබූ කිසිවක් ම මවෙත අද නොවූව ද ඇගේ සිත මේ තරමින් හෝ ගොඩට රැගෙන ඒමට මගේ ඇසුර ඈට පිහිට වූ බව මම දනිමි. ඒ ගැන සිතා තවදුරටත් මට සතුටු විය හැක....

පර්ත්වල ම දිගට ම ජීවත් වනවා ය යන හැඟීමක් මුලින් ම මා වෙත පැවතියේ නැත. නමුත් මම සමාර් සහ ඇඩම් සමඟ මගේ අදහස් කතාබහ කළේ ඔවුන් දක්වන අදහස් මට ප්‍රයෝජනවත් වෙතැයි සිතූ බැවිනි. ඔවුන් දෙදෙනාගේ ම මැදිහත් වීමට අනුව අපේ අධ්‍යාපන පීඨය තුල මහා පරිමාණයෙන් කෙරීගෙන යමින් පවතින පර්යේෂණයක කුඩා කොටස්කරුවෙකු වශයෙන්, පර්යේෂණයක සහයකයකු ලෙසට මට රැකියාවක් ලබා ගැනීමට හැකි විය. ඊට අදාළ ව මුලින් සිටි වීසා වර්ගයෙන් වෙනත් එකකට මාරු වීමට මම උත්සාහ ගත්තෙමි. මගේ අධ්‍යාපන පීඨය වෙතින් ඒ සඳහා මට උපරිම සහය ලැබිනි. මේ අතරතුර ටාන්‍යා ද මට ලිපියක් එවා තිබිණි. ඈ ඉතා සතුටින් වෙසෙන බව එහි සඳහන් විය.

කාලය දිනෙන් දින මසින් මස පියාසර කරමින් තිබිණි. ටාන්‍යා සිංහල ඉගෙන ගන්නා බව ද ඇගේ මුළු විවේක කාලය ම ඒ සඳහා යොද-වන බව ද ඈ මට දන්වා එවා තිබිණි. ටික කාලයක් යන විට කුඩා සරල ලිපියක් මට ලියා එවීමට තරම් ඈ දියුණුවක් ලබා තිබිණි. කුඩා දරු පැටවුන්ට ඉගැන්වීම වෙනුවෙන් මිල කළ නොහැකි මානසික සතුටක් ඈ විඳින බව ද ඇගේ ලිපිවල නිතරම අඩංගු විය. ඉඩ ලැබෙන පරිදි ඈ අම්මාවද මුණ ගැසෙන බව ඈ කියා තිබිණි.

මේ වන විට වසරක් ගෙවී යමින් පැවතිනි. දිගට ම පර්ත් නවතිනවා යැයි මා දෙමාපියන්ට කියන්නට නොගියේ ඔවුන් ඒ අසා කලබල වන බව දත් බැවිනි. නමුත් මට ලැබී තිබූ රැකියාව පිළිබඳව ඔවුන් සතුටට පත්ව සිටි අතර ඒ නිසා ටික කලක් පර්ත්හි නැවතීමට මට සිදුවේ යැයි දැනගැනීම ගැන ඔවුන් සෑහීමකට පත්ව සිටියේය. ස්ථිර පදිංචියට අවශ්‍ය වීසා මේ වන විට මා ඉල්ලුම් කර තිබුණි. ටාන්‍යා ආපසු එන ගමනක් ගැන කිසිවක් ම කියා නොතිබුණා ය. කරුණු යෙදී තිබුන ආකාරය අනුව මගේ උරුමය මෙබන්දක් යැයි වැටහීමක් ඒ වන විට මා වෙත ඇතිවී තිබිණි. නමුත් මගේ ජීවිතය හුදකලාවට ම බාරකර තිබීම ගැන මා දුක්වූවේ වත් පසුතැවිලි වූවේවත් නැත .....

ටාන්‍යාගෙන් නැවත වරක් හදිසියේ ලැබුණු ලිපියක ඈට මහේල මුණගැසුණු බව ලියා තිබිණි. ඔහුගේ විවාහය පිළිබඳව ඔහු පසුතැවිලි වන බවත් මේ වන විට අසාර්ථන නොගැලපෙන විවාහයක දුක් උසුලමින් ඔහු සිටින බවත් ඇගේ ලිපියේ සඳහන් ව තිබිණි. එවැන්නක් දැනගැනීම ද මා තුළ ඇති කළ විශේෂත්වයක් නොවීය.

තවත් මාසයක් පමණ ගතවන්නට ඇත. ටාන්‍යාගෙන් ඊට පසු තොරතුරුක් මට ලැබුණේ නැත. අම්මාට මා කතා කළ ද ඈ දැන සිටි අලුත් යමක් ද නොවී ය.

**ලබන කලාපයට**




